**තුරුසවිය අරමුදල - 2018**
**----------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

තුරුසවිය අරමුදල 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 5 ත් වර්ෂ 16 ත් අතර කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුන ලැබිය යුතු එකතුව රු.851,045 ක ණය ශේෂයෙන් බිම් තරාදි මිලදී ගැනීම සඳහා ලබා දුන් රු. 249,920 ක ණය ශේෂයට අදාල සමිති දැනට අක්‍රීය තත්ත්වයේ පවතින බැවින් ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් සමිති වෙත නැවත වරක් දැනුම් දී ඔවුන්ගෙන් අය කර ගත හැකි උපරිම ණය මුදල අය කර ගැනීමට කටයුතු කිරීමට සූදානම්ව ඇති බැවින් ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | දිගුකාලයක් තිස්සේ අයනොවී පවතින ණය සම්බන්ධයෙන් කටයුතු කලයුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනතේ 32.3 වගන්තිය | අරමුදල පිහිටුවා වසර 16 කට වැඩි කාලයක් ගත වී තිබුණද, මෙම පනතේ නියෝග ගැසට් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් කෙටුම්පත් කරන ලද නියෝග ආයතනය වෙත ලැබී ඇති මුත් පාර්ලිමේන්තුව මඟින් ගැසට් කර ඇතිද යන්න වග තහවුරු කර ගැනීමට ආයතනය සතුව ලියකියවිලි නොමැතිවීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙතින් අවශ්‍ය තොරතුරු ලබාගෙන ඉදිරියේ දී දැනුවත් කරමි. | පනත අනුව නියෝග ගැසට් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) 2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 02 ඡේදය | (i) | රජය විසින් සෘජුව හා වක්‍රාකාර ලෙස අරමුදල් සපයන ආයතන හා රජය වෙත සෘජු හා වක්‍ර ලෙස අවසාන වගකීම් පැවරෙන අරමුදල්වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ජාතික ආර්ථිකයට වඩාත් යහපත් ප්‍රතිඵල ගෙන දෙන විධිමත් ආයෝජන පිළිවෙතක් අනුගමනය කළ යුතු වුවද, සමාලෝචිත වසර තුළ රු. මිලියන 0.4 ත් මිලියන 6.9 ත් අතර, පරාසයක ශේෂයක් නිශ්ක්‍රීයව බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | බැංකු ගිණුමේ ශේෂය හා මුදල් පොතේ ශේෂය සෑම විටම පාහේ මිලියන 1 ½ ත් මිලියන 2 ½ ත් අතර පරාසයක පවතී. ආයතනය විසින් නිකුත් කරන ලද චෙක්පත් ණය හිමියන් අතර නිශ්කාශණය නොවී පැවතීම එයට හේතු වී ඇත. | බැංකු ජංගම ගිණුම්වල නිශ්ක්‍රියව රඳවා නොගෙන එය ඵලදායීව ආයෝජනය කල යුතු වීම. |
| | (ii) | රාජ්‍ය බැංකුවල කළ ආයෝජන කල් පිරුන විට නැවත ආයෝජනය කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව හා භාණ්ඩාගාරය විසින් මැදිකාලීන ආයෝජන සඳහා ගෙවනු ලබන පොලී අනුපාතයට යටත්ව වසර දෙකකට හෝ ඊට වැඩි කාලපරිච්ඡේදයක් සඳහා වන බැංකු තැන්පතු හෝ භාණ්ඩාගාර බැඳුම්කරවල වුවද, අරමුදලේ රු. 6,193,862 ක ආයෝජන 2017 ජනවාරි 02 දින සිට මාස 06 ක කෙටිකාලීනව රාජ්‍ය බැංකුවක ආයෝජනය කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂා කරමි. | භාණ්ඩාගාරය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට අනුව මුදල් ඵලදායී ලෙස ආයෝජනය කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.234,946 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.439,483ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 674,429 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් වෙනත් ආදායම්වල වැඩිවීම හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් ලෙස ලද රු. 1,027,426 ක් ඉකුත් වර්ෂයේ ලද රු.2,180,784 ත් සමඟ සැසඳීමේදී රු. 1,153,358 ක අඩුවීමක් වූ අතර එය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී වූ වෙනස ප්‍රතිශතයක් ලෙස සියයට 52 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රබර් කර්මාන්තය ආශ්‍රිතව වැදගත් වන ආයෝජන ප්‍රවර්ධනය කිරීමට, කුඩා රබර් වතුවල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය රබර් පිරි සැකසුම් ඒකක සහ රබර් කර්මාන්ත ශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම, වැඩිදියුණු කර ගැනීම හෝ පිහිටුවීම, එවැනි රබර් පිරි සැකසුම් ඒකකවල හෝ කර්මාන්ත ශාලාවල නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම අරමුදලේ පරමාර්ථ වුව ද එවැනි කටයුතු ඉටුකිරීමට කටයුතු කර නොතිබුණි. | අප ආයතනයේ පරමාර්ථ හා සැබැදිව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය අයවැය ඇස්තමේන්තුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය වෙත යොමු කරනු ලැබේ. නමුත් මහා භාණ්ඩාගාරය මඟින් වාර්ෂිකව ලබා දෙනු ලබන මූල්‍ය ප්‍රතිපාදන අප ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ.<br>එසේ වුවත් අපහට ලබා දෙන්නා වූ ප්‍රතිපාදන නිසි ලෙස කළමනාකරණය කරගනිමින් කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබේ.<br>එසේම අප ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය අංශ කිහිපයක් හඳුනාගෙන ඒ සඳහා වන සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් මේ වන විටත් අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කර ඇත. එබැවින් අප ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට හා කුඩා රබර් ඉඩම් හිමියන්ට ඵලදායී සේවවාක් ලබාදීමට සංවර්ධන ව්‍යාපෘති සඳහා ද මූල්‍ය ප්‍රතිපාදන ලැබීම අත්‍යවශ්‍යම කරුණක් වේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් මේ වන විටත් අදාළ පාර්ශ්ව දැනුවත් කර ඇති අතර, ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන අනුව ඉදිරියේදී කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | අරමුදලේ පරමාර්ථ ඉටුකර ගැනීම වෙනුවෙන් කටයුතු ක්‍රියාත්මක කලයුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) නිලධාරීන් 05 දෙනෙකු වෙත 2002 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබූ එකතුව රු.320,110 ක් වූ වැටුපෙන් සමාලෝචිත වර්ෂයේ අය කර ගත් රු. 144,000 ක භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි. | පෙර වර්ෂවල මුදල් ද සමග මෙම වර්ෂයේ දී සම්පූර්ණ මුදල මහා භාණ්ඩාගාරය වෙත අමාත්‍යාංශය හරහා ගෙවීමට කටයුතු කරමි. | වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන මගින් වියදම් කල බැවින් එම වියදම නැවත අය කර ගැනීමේදී රාජ්‍ය ආදායමට බැර විය යුතුයි. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කුඩා රබර් වතු හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2018 දෙසැම්බර් 31 වන විට දිස්ත්‍රික්ක 14 ක ලියාපදිංචි සමිති සංඛ්‍යාව 712 ක් වන අතර, එයින් සමිති 329 ක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි. එම අක්‍රිය සමිති ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට හෝ ලියාපදිංචිය අවලංගු කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | මෙම අක්‍රිය සමිති තක්සේරුව සිදු කර ඇත්තේ 2017 වර්ෂයේ දෙසැම්බර් මස තුළදීය. 2019 වර්ෂයේ සිට සියලුම තුරුසවිය සමිති නව ක්‍රමවේදයට අනුව වර්ගීකරණයකට භාජනය කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම ක්‍රියාවලිය හරහා සියලුම සමිති, හඳුනාගත් අංශ කිහිපයක් ඔස්සේ පොදු නිර්ණායක කිහිපයක් අනුව ලකුණු දීමේ ක්‍රම වේදයක් යටතේ මෙම වර්ගීකරණය සිදු කර අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කලයුතු වේ. |
| (ආ)2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ස්ථාපනය කරනු ලැබූ ග්‍රාමීය රබර් සංසද 130 ක් හා සමූහ සැකසුම් මධ්‍යස්ථාන 31 ක් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශ ලේකම්ගේ 2017 මාර්තු 01 දිනැති ලිපියෙන් අරමුදලට පවරා තිබියදී එම සංසද හා සැකසුම් මධ්‍යස්ථාන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි තුරුසවිය සමිති යටතේ ලියාපදිංචි කර ගැනීමේ කටයුතු සිදුකර නොතිබුණි. | තුරුසවිය අරමුදල පනත ප්‍රකාරව මෙම ග්‍රාමීය රබර් සංසද සියල්ලම එකවර තුරුසවිය අරමුදල වෙත පවරා ගැනීමේ හැකියාවක් නොමැත. ඒ සඳහා පළමුව එකී සංසද සියල්ල ක්‍රමානුකූලව "තුරුසවිය සමිති" ලෙස ලියාපදිංචි කර ගත යුතුය. ඒ අනුව මේ වන විට එහි මූලික වැඩකටයුතු සිදුකරමින් පවතී. එසේම සමූහ සැකසුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු ද තුරුසවිය අරමුදලේ සම්බන්ධීකරණ නිලධාරී විසින් සිදු කරනු ලැබේ. එසේම මෙම කාර්යය කඩිනමින් සිදු කර ගැනීමට නොහැකි වූයේ පහත සඳහන් ප්‍රායෝගික ගැටළු පැන නැගීම නිසා බවත් වැඩිදුරටත් දන්වමි.<br>මොණරාගල, බදුල්ල, අම්පාර දිස්ත්‍රික්ක 3 කොට්ඨාශ 29 ක් ආවරණය වන පරිදි පිහිටුවා ඇති තුරුසවිය සමිතිවල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට තුරුසවිය අරමුදලේ එක් නිලධාරියකු පමණක් අනුයුක්තව රාජකාරි කටයුතු කිරීමත් ඔහු විසින් ඊට අමතරව STARR ව්‍යාපෘතියේ,රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හා රබර් පර්යේෂණායතනය සමග ඒකාබද්ධ වැඩසටහන් පැවැත්වීමේ කාර්යන් වල ද නිරත වී සිටීමත් නිසා. | 2017 මාර්තු 01 සිට විගණිත වාර්තාවේ දින වන විට වසර 02 ට වඩා ගත වී ඇති බැවින් පවරා ගැනීමේ කටයුතු තවදුරටත් ප්‍රමාද නොකළ යුතුවේ. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.3,492,301 ක් වැයකර රබර් ෂීට් සැකසීම සඳහා ඉදිකරනු ලැබූ සමූහ සැකසුම් මධ්‍යස්ථාන 03 කින් එකක් වසර 03 කට වැඩි කලක සිට අක්‍රියව පැවතීමත්, අනෙක් 02 හි ඉදිකිරීම් අවසන් නොකිරීමත් නිසා එම සැකසුම් මධ්‍යස්ථාන ඵලදායී ලෙස යොදා ගැනීමට නොහැකි වී තිබුණි. | **1. හැඩිගල්ල සමූහ සැකසුම් මධ්‍යස්ථානය**<br>මෙහි නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා නො.10, දෙහිගහවෙල, බෝම්බුවල යන ලිපිනයේ පදිංචි එච්. ඩී. නිමල් මහතා විසින් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව තුරුසවිය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙම ඉල්ලීම යොමු කර ලබා දෙනු ලබන තීරණය මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.<br><br>**2. ගනේපල්ල සමූහ සැකසුම් මධ්‍යස්ථානය**<br>2008 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද මෙම සමූහ සැකසුම් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. 2008 වර්ෂයේ මෙම සමූහ සැකසුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේදී ප්‍රදේශවාසීන් විසින් පරිසර දූෂණය සම්බන්ධ ගැටළුවක් මුල් කරගෙන විරෝධතාවයක් එල කිරීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතරමග නතර කිරීමට සිදු විය. එසේම වර්තමානය වන විට ප්‍රදේශයේ රබර් ගොවීන් ද වෙනත් වගාවන් සඳහා යොමු වී ඇති බැවින් තුරුසවිය සමිතිය ද අක්‍රිය ව පවතී.<br><br>**3.ඇරැපොල එක්සත් සමූහ සැකසුම් මධ්‍යස්ථානය**<br>මෙම සමූහ සැකසුම් මධ්‍යස්ථානයේ ද ඉදිකිරීම් කටයුතු අතරමග නවතා ඇත. රබර් මිලෙහි පහත වැටීම හේතුවෙන් කුඩා රබර් ඉඩම් හිමියන් රබර් වගාවෙන් ඈත්වීම හේතුවෙන් වර්තමානයේ සමිතිය අක්‍රියව පවතී.<br>මෙම සමූහ සැකසුම් මධ්‍යස්ථාන දෙකෙහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ඉදිරියේදී මෙම ප්‍රදේශයේ දැනට රබර් වගාවේ නියැලී සිටින කුඩා රබර් ඉඩම් හිමියන් සමග සාකච්ඡා කර තුරුසවිය අරමුදල කළමනාකරණ මණ්ඩලයේද අනුමැතිය ලබා ගැනීමෙන් පසු සුදුසු පියවරක් ගැනීමට කටයුතු කරන බව දන්වමි. | වත්කම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගතයුතු බව. |